# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2417/27 - 2025 ජනවාරි මස 01 වැනි බදාදා - 2025.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සළකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**අනුර කරුණාතිලක** (පා.ම.),
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 26 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
''සෙත්සිරිපාය'' අදියර - II,
බත්තරමුල්ල.


1A - PG 6971 — 19 (2025/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

*ඇහැලියගොඩ නාගරික බලප්‍රදේශය*

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රය අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් බවට පත්කළ අංක 1629/16 හා 2009.11.26 දින දරන රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ නාගරික බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 126 බී අස්ගඟුල උතුර, 126සී අස්ගඟුල දකුණ, 126 මාහර, 126ඒ මාහිංගොඩ, 136ඒ කැන්දන්ගමුව නගරය, 136ඩී මෝරගල, 136ජී යකුදාගොඩ, 136 කැන්දන්ගමුව ඉහළගම, 136එෆ් උඩුමත්ත, 138බී ගනේගොඩ කොටසක්, 136බී විලේගොඩ කොටසක්, 137ඊ බෝපැත්ත දිද්ද කොටසක්, 136ඊ පැල්පිටිය කොටසක්, 141 බුළුගහපිටිය කොටසක්, 141බී පලීගල කොටසක්, 140 කැන්දන්ගමුව පහලගම කොටසක්, 141ඒ නැදුරන කොටසක්, 140බී නාකන්දල කොටසක්, 140ඒ වියලගොඩ කොටසක්, 137ඩී විලේගොඩ නැගෙනහිර කොටසක්, 126ඩී ඇහැලියගොඩවත්ත කොටසක්, 136සී තොරණගොඩ කොටසක් යන ග්‍රාම නිලධාරී කොට්ඨාසයන් සහ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ 146 තලාවිටිය කොටසක්, 146ඒ අමුහේන්කන්ද කොටසක්, 146බී බෝධිමළුව කොටසක් යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අමතරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අංක 138බී ගනේගොඩ ඉතිරි කොටස, 136බී විලේගොඩ ඉතිරි කොටස, 136ඊ පැල්පිටිය ඉතිරි කොටස, 141 බුළුගහපිටිය ඉතිරි කොටස, 140 කැන්දන්ගමුව පහලගම ඉතිරි කොටස, 137 ඩී විලේගොඩ නැගෙනහිර ඉතිරි කොටස, 136සී තොරණගොඩ ඉතිරිකොටස, 137බී දිව්රුම්පිටිය, 137සී ගැටහැත්ත, 137 වලව්ට, 137ඒ මින්හාන, යන ග්‍රාම නිලධාරී වසම් සහ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අංක 146 තලාවිටිය ඉතිරි කොටස, 146ඒ අමුහේන්කන්ද ඉතිරි කොටස, 146බී බෝධිමළුව ඉතිරි කොටස, 158 පුස්සැල්ල, අංක 127සී මෙනේරිපිටිය, අංක 127ඒ පරකඩුව, අංක 147බී දෙහෙරගොඩ යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත පිළිවෙලින් ඇහැලියගොඩ හා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට අයත්වන්නා වූ මෙහි II වන තීරුවෙන් විස්තර වන ඉම් හා මායිම් වලින් යුක්ත මුළුමහත් භූමි ප්‍රදේශය වේ.

*II වැනි තීරුව*

*උතුරට* :

දිවුරුම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හා එකී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය ආරම්භක ලක්ෂය ලෙස ගෙන එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර ඊසාන සහ දකුණු දිශානුගතව කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය ඡේදනය කරමින් නැවතත් ඊසාන සහ දකුණු දිශානුගතව ගැටහැත්ත ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ උතුරු හා නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන සහ දකුණු දෙසට මීන්තාන ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ උතුරු මායිම ඔස්සේ, ඊසාන සහ ගිණිකොන දිශානුගතව බෝපැත්ත දිද්ද වසමේ උතුරු හා බටහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද

*නැගෙනහිරට* :

එතැන් සිට එකි වසමේ බටහිර මායිම ඔස්සේ නිරිත දිශානුගතව නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2009.11.26 දිනැති අංක 1629/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර ඇති එකී වසමට අයත් ප්‍රකාශිත බල ප්‍රදේශ මායිම වන බේරුවානවත්ත අක්කර 50 පාරේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද, එතැන් සිට උක්ත මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දෙසට තොරණගොඩ ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට තොරණගොඩ ග්‍රාම නිලධාරී වසමේ උතුරු හා නැගෙනහිර මායිම ඔස්සේ නැවතත් නාගරික සංවර්ධන අධිකාරියේ ඉහත කී ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත බල ප්‍රදේශ මායිම වන පාළුගෙදරවත්ත මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද, එතැන් සිට උක්ත මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට සහ නැගෙනහිර දෙසට අඳින ලද රේඛාව ගල්අමුණා අඩිපාර හමුවන තෙක්ද, එතැන් සිට එම අඩිපාර ඔස්සේ ගිනිකොන දෙසට අඳින ලද රේඛාව උඩුමත්ත පාළු මාවතේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද, එතැන් සිට එම මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ තෝරපල සුසාන භූමියට යාබදව ඇති මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිනිකොන දෙසට බෝපැත්ත මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද, එතැන් සිට එකී මාර්ගය ඔස්සේ ගිනිකොන දෙසට විලේගොඩ ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන දෙසට එකී වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට විලේගොඩ ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දිශානුගතව විල්ගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ උතුරු සහ නැගෙනහිර මායිම ඔස්සේ නැගෙනහිර හා දකුණු දෙසට ඇහැලියගොඩ - පනාවල මාර්ගය ඡේදනය කරමින් 2/3 බෝක්කුවේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂය දක්වා ද, එතැන් සිට නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2009.11.26 දිනැති අංක 1629/16 දරන *අති*

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| | *විශෙෂ ගැසට් පත්‍රය* මගින් දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති ඇහැලියගොඩවත්ත වසමට අයත් ප්‍රකාශිත බල ප්‍රදේශ මායිම් හමුවන ලක්ෂය දක්වාද, එතැන් සිට එකී ප්‍රකාශිත මායිම් ඔස්සේ දකුණු දෙසට අස්ගගුල දකුණ ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම එනම් ඇහැලියගොඩවත්ත ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඔස්සේ එනම් මාහර ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ මාහිංගොඩ ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට අමුහේන්කන්ද ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන ලක්ෂය දක්වාද, එතැන් සිට එකී වසමේ බටහිර උතුරු හා නැගෙනහිර මායිම ඔස්සේ නැගෙනහිර උතුරු සහ දකුණු දිශානුගතව පරකඩුව ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ උතුරු හා නැගෙනහිර මායිම ඔස්සේ මෙනේරිපිටිය වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ උතුරු හා නැගෙනහිර මායිම ඔස්සේ ඊශාන සහ ගිණිකොණ දිශානුගතව පුස්සැල්ල වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ උතුරු, නැගෙනහිර හා දකුණු මායිම් ඔස්සේ කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂය දක්වා ද,<br><br>*දකුණට* :<br><br>අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට පුස්සැල්ල ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඔස්සේ වයඹ සහ ඊශාන දිශානුගතව මෙනේරිපිටිය වසමේ දකුණු සහ බටහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ බටහිර මායිම ඔස්සේ වයඹ දිශානුගතව බෝධිමළුව වසමේ දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ දකුණු මායිම ඔස්සේ බටහිර දිශානුගතව තලාවිටිය වසමේ දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ දකුණු මායිම ඔස්සේ බටහිර දිශානුගතව දෙහෙරගොඩ ග්‍රාම නිලධාරි වසමේ උතුරු සහ නැගෙනහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ නැගෙනහිර, දකුණු සහ බටහිර මායිම ඔස්සේ වියලගොඩ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද,<br><br>*බටහිරට* :<br><br>අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට වියලගොඩ ග්‍රාම නිලධරි වසමේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2009.11.26 දිනැති අංක 1629/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රකාශිත මායිම් දක්වාද, එතැන් සිට එකී නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ මායිම් ඔස්සේ නාකන්දල වසමේ උතුරු මායිම එනම් කැන්දන්ගමුව පහලගම ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම වන කිරිඇල්ල - ඇහැලියගොඩ මාර්ගය ඡේදනය කරමින් එකී දකුණු මායිම ඔස්සේ නැදුරන ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර සහ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී නැදුරන වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව නැදුරන ග්‍රාම නිලධාරී වසමට අදාළව නාගරික සංවර්ධන අධිකාරිය මගින් |

**උපලේඛනය** *(සම්බන්ධිතයි)*

| *I වන තීරුව* | *II වන තීරුව* |
| --- | --- |
| | ප්‍රකාශිත බල ප්‍රදේශ මායිම වන ඇහැලියගොඩ - කිරිඇල්ල මාර්ගය නැවතත් හමුවන ලක්ෂය දක්වාද, එකී මාර්ගය ඔස්සේ දකුණු දෙසට ගොස් පහලගම බෙලගහ යට හන්දිය අසල පාසල් මාවත ඔස්සේ නැවතත් කැන්දගමුව පහලගම ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ දකුණු සහ බටහිර මායිම් ඔස්සේ උතුරු සහ ඊශාන දිශානුගතව නැවතත් නාගරික සංවර්ධන අධිකාරිය මගින් පලීගල වසමට අදාළව ප්‍රකාශයට පත් කරන ලද නාගරික බල ප්‍රදේශ මායිම ඔස්සේ බුළුගහපිටිය ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමෙහි දකුණු හා බටහිර මායිම් ඔස්සේ ගනේගොඩ ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ දකුණු හා බටහිර මායිම් ඔස්සේ උතුරු දිශානුගතව මීන්තාන වසමෙහි දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමෙහි දකුණු හා බටහිර මායිම් ඔස්සේ වලව්ට ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමේ දකුණු මායිම ඔස්සේ වයඹ දිශානුගතව කරඳන මාර්ගයේ මධ්‍ය ලක්ෂය ඡේදනය කරමින් ගැටහැත්ත ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු මායිම හමුවන ලක්ෂය දක්වාද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු හා බටහිර මායිම් ඔස්සේ උතුරු දිශානුගතව දිවුරුම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ දකුණු සහ බටහිර මායිම හමුවන ලක්ෂය දක්වාද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඔස්සේ එකී වසමෙහි උතුරු මායිම වන |

EOG 01 - 0005

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.